චක්‍රලේඛ අංක - **PE/2024/39**

මගේ අංකය: TR/PE/2024/ CIR
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2024.10.17 දින.

**TR - 06**

**ඉතා වැදගත්**

**සියළුම තේරීම්භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14**
**ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීම.**

2024.11.14 වැනි දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ දී අවශ්‍යතාව අනුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම පිණිස ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීමට හැකියාව ඇත.

02). පසුගිය ජනාධිපතිවරණයේ දී බස්රථ ලබාදුන් මිලටම මෙවරද බස්රථ ලබාදිය හැකි බව, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) විසින් මා වෙත දන්වා ඇති අතර, එම මිල ගණන් පහත පරිදි වේ. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඩිපෝ කළමණාකරුවන් සමග සාකච්ඡා කර ඔබට අවශ්‍ය බස්රථ ප්‍රමාණය කල්වේලා ඇතිව වෙන්කරවා ගන්න. ඩිපෝ කළමණාකරුවන්ගේ නාමලේඛනය ඇමුණුම 1 හි දක්වා ඇත.

❖ සාමාන්‍ය බස්රථ (ආසන 40 ට වැඩි)

| විස්තරය | ගාස්තුව |
|---|---|
| එක් දිනකට අවම අය කිරීම<br>අවම ගාස්තුව යටතේ ධාවනය කළ හැකි උපරිම කි.මී. ප්‍රමාණය කි.මී. 100<br>ලබාදිය හැකි උපරිම කාලය පැය 12 | රු.30,000.00 |
| කි.මී.100 ට වැඩි වූ විට අමතර කි.මී.1 කට ගාස්තුව | රු. 165.00 |
| ලබා දෙන කාලය ඉක්මවන අමතර සුක්කානම් පැයක් සඳහා අය කිරීම.<br>( අමතර කාලය ගණනය කිරීම කි.මී.10 සඳහා පැය 01 ) | රු. 500.00 |
| එක් දිනක් සඳහා රාත්‍රී නැවතුම් ගාස්තුව | රු. 1,500.00 |

❖ සාමාන්‍ය බස් රථ (ආසන 40 අඩු )

| විස්තරය | ගාස්තුව |
|---|---|
| එක් දිනකට අවම අය කිරීම<br>අවම ගාස්තුව යටතේ ධාවනය කළ හැකි උපරිම කි.මී. ප්‍රමාණය කි.මී. 100<br>ලබාදිය හැකි උපරිම කාලය පැය 12 | රු.27,000.00 |
| කි.මී.100 ට වැඩි වූ විට අමතර කි.මී.1 කට ගාස්තුව | රු. 165.00 |
| ලබා දෙන කාලය ඉක්මවන අමතර සුක්කානම් පැයක් සඳහා අය කිරීම.<br>( අමතර කාලය ගණනය කිරීම කි.මී.10 සඳහා පැය 01 ) | රු. 500.00 |
| එක් දිනක් සඳහා රාත්‍රී නැවතුම් ගාස්තුව | රු. 1,500.00 |

03). මේ අනුව ඔබ විසින් යොදා ගැනීමට අපේක්ෂිත ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ ප්‍රමාණය කොතෙක් ද යන්න, අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ද ලිඛිතව දන්වන්නේ නම් මැනවි. ඡන්ද විමසීම අවසන්වීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ඔබ විසින් ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට ද කරුණාකර කටයුතු කරන්න.

04). ඉහත අංක 02 ඡේදයේ සඳහන් ගෙවීම් වලට අමතරව රියදුරු සඳහා වූ ගෙවීමක් ලෙස දිනකට රු.900/- ක මුදලක් ගෙවිය යුතුය. රිය සහායකවරයෙකු (කොන්දොස්තරවරයෙකු) සිටී නම් ඔහු වෙනුවෙන් ද දිනකට රු.900/- ක මුදලක් ගෙවිය හැකිය. මෙම බස්රථ ඡන්ද විමසීමේ දිනයට පෙරදින (එනම් 2024.11.13 දින) උදෑසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත කැඳවීම ප්‍රමාණවත් වන අතර, ඒ අනුව දින දෙකකට මෙම ගෙවීම කළ හැකිය.

05.) මෙම වැඩ පිළිවෙල සංවිධානය කර ගැනීමේදී මේ සමඟ ඇති ලැයිස්තුවේ සඳහන් ඔබ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය කළමණාකරු අමතා ඔහුගේ සහාය ඔබට ලබා ගත හැකිය.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් : 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය } මේ පිළිබඳව සියළුම දිස්ත්‍රික්කයන්හි ඩිපෝ කළමණාකරුවන් දැනුම්වත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
3. විගණකාධිපති
4. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ/පාලන))
5. ප්‍රධාන මූල්‍ය නිලධාරී
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක

} කාරුණික දැන ගැනීම පිණිස

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

දුරකථන අංක : 011-2581120-4
ෆැක්ස් අංක : 011-2586491
ඊ මේල් : ceo@sltb.lk

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ විස්තර ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ විස්තර පහතින් දැක්වේ.

| අනු අංකය | ප්‍රාදේශීය කාර්යාලය | කළමණාකරුගේ නම | දුරකතන අංකය |
|---|---|---|---|
| 1 | කොළඹ | එල්.එච්. ප්‍රසන්න ප්‍රියදර්ශන මහතා | 0771056300 |
| 2 | කළුතර | තිලක් මහතා | 0771056700 |
| 3 | රුහුණ | ආර්.ඒ.පී. කුමාර මහතා | 0771056800 |
| 4 | ඌව | එල්.එල්.එස්. ලියනගේ මහතා | 0771057700 |
| 5 | සබරගමුව | ඒ.එම්.පී.කේ. අලහකෝන් මහතා | 0771057500 |
| 6 | ගම්පහ | ඊ.එන්. සමන් මහතා | 0771056500 |
| 7 | වයඹ | ඩී.පී.කේ.ඒ. පතිරණ මහතා | 0771057200 |
| 8 | මහනුවර | ඩී. සනත් ප්‍රසන්න කුමාර මහතා | 0771057000 |
| 9 | නුවරඑළිය | ඩී.එම්.ආර්.ජේ.බී. දසනායක මහතා | 0771057400 |
| 10 | නැගෙනහිර | ආර්.එම්.ඩී. විජිත ධර්මසේන මහතා | 0771058200 |
| 11 | උතුර | කේ. කේජිසන් මහතා | 0771058100 |
| 12 | රජරට | ආර්.එම්.ඒ.බී. රාජකරුණා මහතා | 0771057900 |